**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය - 2010**

---------------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

------------------------------------------------------------------

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 1 රු. 275,642 ක් වූ සංවර්ධන පිරිවැය අදාල ආර්ථික ප්‍රතිලාභ හඳුනාගත් රටාවට අනුව ක්‍රමවත් පදනමකට ක්‍රමක්ෂය කර වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අන්තර්ගත කොට නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. - 3 වත්කම්, වගකීම් සහ ආදායම්, වියදම් ප්‍රමාණාත්මක වන විට වෙනම වාර්තා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී වෘත්තීය පරීක්ෂණ වැඩ සටහන් වලින් ලද ආදායම වූ රු. 108,500 වෘත්තීය පරීක්ෂණ වැඩසටහන් වත්කම් ගිණුමෙන් අඩුකොට අනුචිත ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පෙර වර්ෂයේ ගෙවා තිබූ සමාලෝචිත වර්ෂයට අදාල රු. 52,483 ක් ව වියදම්, සමාලෝචිත වර්ෂයට අදාල වියදම් ලෙස ගිණුම් වලට නොගෙන ඉදිරි ගෙවුම් යටතේ දක්වා තිබුණි.

(ආ) රු. 217,778 ක් වූ පැසිපික් ප්‍රතීතන කවුන්සිලය සඳහා වූ දායක මුදල ආසියා පැසිපික් පරීක්ෂණාගාර ප්‍රතීතන සංස්ථාව (APLAC) සඳහා වූ දායක මුදලක් ලෙස අනුචිත ලෙස දක්වා තිබුණි.

1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 අප්‍රේල් 20 දිනැති අංක එම්එෆ් 6/1/1/96 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය 2:1:4 ඡේදය | නිලධාරීන් 4 දෙනෙකු වෙනුවෙන් ලබාදුන් රු. 122,937 ක අනියම් දීමනා සඳහා වූ අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ආ) | 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 10.9 හා 10.10 වගන්ති | නිලධාරීන් 4 දෙනෙකු සහභාගි වූ විදේශ ගමන් සඳහා පොදු 126 ආකෘතිය මගින් නිවාඩු අනුමත කරගෙන නොතිබූ අතර, අනුමත කල නිවාඩු විස්තර පිටපතක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රජයේ යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. 8.5 වගන්තිය | මණ්ඩලය සතුව ඇති ස්ථාවර වත්කම් ආවරණය වන පරිදි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඈ) | 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ | සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන |

| | | |
|---|---|---|
| | විගණන චක්‍රලේඛය 9 ඡේදය | වාර්තාවක් පිළියෙල කල යුතු වුවද, එකී වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 1971 අංක 38 දරන මුදල් පනත 14:4 වගන්තිය | 2008 හා 2009 වර්ෂ වලට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2010 ඔක්තෝබර් 11 දිනැති අංක එම්ඕඑෆ්පී/01/2010/01 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය 3 වගන්තිය. | විදේශ ආයතනයෙන් දීමනා ගෙවා තිබියදීත් එක් නිලධාරියෙකු වෙත විදේශ පුහුණු වැඩසටහන් වෙනුවෙන් අනියම් දීමනා වශයෙන් රු. 14,065 ක් ගෙවීම් කර තිබුණි. |
| (උ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනත 9 වගන්තිය 2 ඡේදය | අර්ථසාධක අරමුදල් ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව ඇතුලත් කළ යුතු වුවත් එසේ නොකිරීම නිසා අර්ථසාධක අරමුදල් දායකය රු. 77,019 කින් අඩුවෙන් දක්වා තිබුණි. |
| (ඌ) | 1988 අංක 47 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත 16 වගන්තිය 2 ඡේදය | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකය ගණනය කිරීමේදී ජීවන වියදම් දීමනාව ඇතුලත් කළ යුතු වුවත් එසේ නොකිරීම නිසා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් දායකය රු. 15,404 කින් අඩුවෙන් දක්වා තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-----------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

--------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය වූ රු. 8,910,000 ගණන් ගැනීමෙන් පසු අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වැඩ කටයුතු වලින් රු. 359,485 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් වූ රු. 11,470,000 ක රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 588,716 ක අතිරික්තයක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 948,201 ක අඩුවීමක් දක්නට ලැබුණි.

2.2 මෙහෙයුම් සමාලෝචනය
--------------------------

2.2.1 කාර්ය සාධනය
-----------------

සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත කාර්ය සාධනය හා තථ්‍ය කාර්ය සාධනය පහත දැක්වේ.

(අ)

| ඉලක්ක ගත කාර්ය සාධනය | තථ්‍ය කාර්ය සාධනය |
| --- | --- |
| වෛද්‍ය රසායනාගාර 10 ක් සහතික කිරීමේ ආයතන 05 ක් සහ රසායනාගාර පරීක්ෂණ ආයතන 10 ක් ප්‍රතීතනයට ලක් කිරීම. | සහතික කිරීමේ ආයතන 01 ක් හා රසායනාගාර පරීක්ෂණ ආයතන 10 ක් පමණක් ප්‍රතීතනය කර තිබුණි. |
| පුහුණු වැඩසටහන් 12 ක් සහ පුද්ගලයින් 240 ක් පුහුණු කිරීම. | පුහුණු වැඩසටහන් 01 ක් සහ පුද්ගලයින් 19 දෙනෙකු පමණක් පුහුණු කිරීම. |
| පරීක්ෂණ ආයතනවල පරිපාටි අත්පොත අනුමත කර ගැනීම. | අනුමත කරගෙන නොතිබුණි. |

(ආ) ආයතනයේ ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පරීක්ෂණ ආයතන (Inspection bodies) ප්‍රතීතනයට ලක්කර නොතිබූ අතර, සුදුසුකම්ලත් තක්සේරුකරුවන් 11 දෙනෙකුගෙන් යුත් සංචිතයක් මණ්ඩලයේ ස්ථාපිත කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ ප්‍රතීතනය ප්‍රදානය කරන ලද අංක එම්එල්-03-01 හා එම්එල්-06-01 දරන වෛද්‍ය රසායනාගාර (Medical Laboratories) සඳහා පළමු රඳවා ගැනීමේ පරීක්ෂාව (Frist Survelliance test) සිදු කර නොතිබුණි. පරීක්ෂාව ප්‍රමාද කරන ලෙස දැනුම්දීම මීට හේතුව බව දැනුම් දී ඇත.

2.2.2 අයවැය ලේඛනමය පාලනය
-----------------------------

සමාලෝචිත වර්ෂය තුල අයවැය හා තථ්‍ය වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.2.3 සංයුක්ත සැලැස්ම
-------------------

ආයතනය විසින් 2009-2013 වර්ෂ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් එය වර්තමාන ප්‍රවණතාවයන් සැලකිල්ලට ගෙන යාවත්කාලීන කර නොතිබුණි. තවද සංයුක්ත සැලැස්මට ඇතුලත් විය යුතු ප්‍රධාන අංග වන ශුදුඅත විශ්ලේෂණය, පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය හා 2009 වර්ෂයට අදාල ක්‍රියාකාර සැලැස්ම ඇතුලත් වී නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රතීතන ප්‍රදානය

(ඇ) විදේශ ගමන්

(ඈ) වාහන ධාවනය